# DINNER DANCE WITH MUSIC WEST END CONCERT



මහින්ද දිසානායක දිවුල්ගනේ.

මෑතකදී මහත්සේ ජනප්‍රියත්වයට පත්වී ඇති නර්තනය නම් කලාංගයේ උත්භවය දශක ගණණාවක් ඉදිරියට ගමන් කරයි. එදා සිට අද දක්වා විකාශනය වූ නර්තනය විවිධාංගයන්ගෙන් පරිපෝෂිත බවට පතිවී තිබේ. විශේෂයෙන් පෙරදිග හා අපරදිග නර්තන අංගයන්ගේ සම්මිශ්‍රණයෙන් හා අපගේ ජාතියට රටට අනන්‍ය වූ නර්තන ක්‍රමයක් ලැබීම අපි එක අයුරකින් භාග්‍යවන්තයෝ වෙමු. එම නර්තනාංග මෙල්බන් වෙසෙන, ශ්‍රී ලාංකීයන්ට හඳුන්වා දෙන්නට හා එම උසස් නිර්මාණ රසවිදීමට ලබා දෙන්නට මෙවරත් මෙම වෙස්ට් එන්ඩ් සංවිධානය සමත් වෙයි.

පසුගිය වසරේ ඉතා උසස් ලෙස රසික ප්‍රසාදය ලැබු මෙම ප්‍රසංගය නැවතත් මෙම වසරේ වෙනස්කම් රාශියක් ඇතුලත්ව ගිය වසරටත් වඩා නිර්මාණාත්මක ගුණාත්මක බවකින් ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කිරීමට හා ඔවුන්ද ඒ සඳහා සහභාගි කර ගැනීමට බලාපොරොත්තු වීම විශේෂයකි. ගිය වසරේ මෙන් මෙවරත් අපගේ ප්‍රසාදය හා ගෞරවයට පාත්‍ර වූ ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම නර්තන ශිල්පී චන්දන වික්‍රමසිංහයන් සහභාගිවීම හා ඔහුගේ මූලිකත්වයෙන් ප්‍රසංගය පැවැත්වීම වැදගත් වේ. එපමණක් නොව ශ්‍රී ලංකාවේ. කලා හිතකාමී ප්‍රේක්ෂක ජනතාව අතර මෑතකදී '' අබා'' චිත්‍රපටයෙන් කලාලෝකයට පිවිසි දිදුලන තාරකාව වූ දුලානි අනුරාධා සහ ශ්‍රී ලාංකීය නර්තන කණ්ඩායම සහභාගී වෙමින් ඔබ සඳහා උසස් වින්දනයක් ලබා දීමට West End සංවිධානයේ සභාපති සුසිල් රත්නසේකරයන් ඇතුලු කණ්ඩායම



සංවිධානය වී සිටීම සතුටට කරුණකි. මෙම සංගමයේ අරමුණු ඉතාම සමාජයට වැඩදායී කරුණු වලින් සමන්විතයි. තරුණ පිරිස වැඩදායි ලෙස සමාජයට සමීප කිරීම, උසස් පරමාර්ථ හා අරමුණු පෙරදැරිව සංස්කෘතිකමය සමාජ පසුබිමක් අප සමාජයට දායක කිරීම, දෙමාපියන් දරුවන් හා තරුණියන් අතර සාමූහික බැඳීම අධ්‍යාපනය තුළින් දරුවන්ට හඳුන්වා දීම යන උසස් වූ අරමුණු ඇතුලත් වේ. එම අරමුණු ඉටුකිරිමේ එක් ක්‍රමයක් ලෙස මෙසේ ඔබ හමුවීමට මේ ප්‍රසංගයෙන් බලාපොරොත්තු වේ. එලෙස මෙවර ළමයි උදෙසා විශේෂ සංගීත හෝරාවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබීම ද සතුටකි.




නර්ථනය, ගීතය, සංගීතය යන මේ සෑම අංගයකින්ම ඔබව පිනවීමට රසගැන්වීමට කටයුතු සංවිධානය වී තිබෙනවා පමණක් නොව ඔබට හැකිතරම් නටන්නටද විනෝද වන්නටද අවස්ථාව සැලසී තිබේ. ඔබ සමඟ පැමිණෙන දරු දැරියන්ටද හොඳ ප්‍රයෝජනවත් රාත්‍රියක් වනවාට කිසිම සැකයක් නැත. ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන මෙම ජනප්‍රිය ශිල්පීන් සමඟ කතා බස් කරන්නට ඔබේ හිතවතුන් හමුවීමට හොඳම අවස්ථාවක් වේ.



මෙම ප්‍රසංගයේ ආදායම වැය කරන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියඹලාගස්වැව ශ්‍රී පූර්වාරාම විහාරස්ථානයේ බෝධිඝරය සහිත විහාර මන්දිරයේ විදුලිය ලබාගැනීම සඳහා ය

මෙම '' වෙස්ට් එන්ඩ්'' සංවිධානය විශේෂ අරමුණක් වෙනුවෙන් මෙම නර්තන ප්‍රසංගය පවත්වයි. අනුරාධපුර තඹුත්තේගම සියඹලා ගස් වැව අභිනවාරාම විහාරස්ථානයට විදුලිය ලබා ගැනීම සඳහා මෙන්ම අසරණ වූ කළා කරුවන් වෙනුවෙන් ඔවුන්ගේ සුබසාධනය සඳහාද යන කරුණු විශේෂ වෙයි. ඒ අනුව පුණ්‍ය කටයුත්තක් මෙන්ම සුභසාධන වැඩ පිළිවෙළක් වෙනුවෙන් ඔබේ මුදළ පරිත්‍යාග වීමේද මෙහිදී සඳහන් කළ හැකියි.

විශේෂයෙන් හැකි තරම් නටන්නට විනෝද වන්නට මේ රාත්‍රිය වෙන්වෙනවා මෙන්ම ඔබට හොඳ කෑම වේළක් රස විදීමටද අවස්ථාව සැපයේ. මෙල්බන් කාගෙත් ප්‍රසාදය දිනා ගත් ආහාර සැපයීමට වෙෆ් ලංකා ආයතනය ඔබ සඳහා සැදී පැහැදී සිටී. මේ සියල්ල එක්තැනකද සෞම්‍ය වූ සුන්දර වූ රාත්‍රියකට ඔබ සැමට ආරාධනා කරයි. එනම් දුලානි හා චන්දන ඇතුලු පිරිස ඉදිරිපත්කරන සුසිල් රත්නසේකර අධ්‍යක්ෂණය කරන DINNER DANCE WITH MUSIC CONCERT වෙස්ට් එන්ඩ් සංවිධානය සාදරයෙන් ඔබ සඳහා ඉදිරිප්ත කරයි. මේ නර්තන ප්‍රසංගය COBURA TOWN HALL හිදී ජූලි 11 වෙනිදා සවස 6.30 සිට මධ්‍යම රාත්‍රිය දක්වා පැවැත්වේ. මෙල්බන් වාසී ඔබට කාරුණික ආරාධනා.

**සමුද්‍රා - 0411569811**
**නිශාන්ත - 0433878579**

ACCELERATED LEARNING
SCHOLARSHIP COACHING
VCE MATHS & YEAR 3-12 MATHS

SUNSHINE - WERRIBEE - DANDENONG

METROPOLITAN COLLEGE OF EDUCATION

- YEAR 5, 6 & 7 ENTRY SCHOLARSHIPS
- MELBOURNE HIGH, MAC.ROB, NOSSAL, SUZANE CORY 9 AND YEAR 10 ENTRY
- JOHN MONASH SCIENCE SCHOOL EXAM FOR YEAR 10 ENTRY
- MATHS, PROBLEM SOLVING SKILLS IMPROVEMENT FOR YEARS 3 TO 12
- VCE FURTHER/METHODS/ SPECIALIST/ACCOUNTING/IT



Physics, Chemistry, UMAT preparation and English /Maths Years 3 - VCE

Coordinated & Conducted by
Uni Lecturer Susil Ratnasekara

www.collegeofmathematics.com
METROPOLITAN COLLEGE OF MATHEMATICS
8390 1441 • 0411 569 811